WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

44 | S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

නැටුම් (දේශීය)	I, II
நடனம் (சுதேச)	I, II
Dancing (Oriental)	I, II

නැටුම් (දේශීය) II

- **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු **12** බැගින් හිමි වේ.

1. **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) රාජ සභාවේ රජුන් පිළිබඳව ගුණ වර්ණනා ඉදිරිපත් කරන ගායකයින් ..... ලෙස හඳුන්වනු ලැබේ.

(ii) භාරතීය 'අභිනය දර්පනම්' යන ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ ..... විසිනි.

(iii) උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් පන්තේරු නර්තනය ..... නැටුම් විශේෂයක් ලෙස ද හඳුන්වනු ලැබේ.

(iv) තාලය තැබීමට ප්‍රථම ගායනය ආරම්භ කිරීම හඳුන්වනු ලබන්නේ ..... ග්‍රහ ලෙස ය.

(v) මහා පරාක්‍රමබාහු රජතුමා නැටුම්, ගැයුම්, වැයුම් උදෙසා ..... ඉදිකළ බව මහාවංශයේ සඳහන් ය.

(vi) ශ්‍රී ලංකාවේ සංස්කෘතික දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ ..... වර්ෂයේ දී ය.

(vii) කථක් නර්තන සම්ප්‍රදාය, උත්තර භාරතීය ..... සංගීතය හා සබැඳේ.

(viii) චිත්‍රයකට අවශ්‍ය පසුබිම බාහිර ස්වරූපය වෙනස් කිරීම ..... නමින් හැඳින්වේ.

(ix) පහත දැක්වෙන ඓතිහාසික මූලාශ්‍රය අයත් යුග නම් කරන්න.

(අ) පාලමොට්ටායි සෙල්ලිපිය : .....

(ආ) කොරවක්ගල සෙල්ලිපිය : .....

(x) 'රන්දද' සහ 'හිරෝෂිමා' යන මුද්‍රානාට්‍ය දෙකෙහි නිර්මාණකරුවෝ කවුරුන් ද?

(අ) රන්දද : .....

(ආ) හිරෝෂිමා : .....

WWW.OLEVELAPI.COM

2. (i) සුළු මැදුම් දෙතිනට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.

(ii) "යුද්දෙටත් ඇවිත් සිඳුපිට නැව් නැගිලා පරංගි - උන්නමුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා" මෙම කවි පද දෙක මැදුම් තනි තිනට ප්‍රස්තාරගත කරන්න.

(iii) සැවිලා හෝ මණ්ඩුක වන්නමේ අඩවිව හෝ නාතිලිංචි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ ප්‍රස්තාරගත කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) රංග රචනය

(ii) වන්නම්/ සින්දු වන්නම්

(iii) ගීත අනුව නර්තන නිර්මාණ

(iv) මඟුල් බෙර වාදනය

(v) එස්. පණිහාරත මහතා

[අවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...


4. උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්මයන්හි එකිනෙකට ආවේණික වූ සුවිශේෂතා පෙන්නුම් කරයි.
   (i) කොහොඹා කංකාරියෙහි අයිලය සහ යහන හඳුන්වන්න.
   (ii) දෙවොල් මඩුවෙහි කාලපන්දම්ගස පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
   (iii) පහන්මඩුවේ නාට්‍යමය අවස්ථා **දෙකක්** පැහැදිලි කරන්න.

5. (i) නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම කරුණු **හතරක්** යටතේ ලියා දක්වන්න.
   (ii) අනාඝාතාත්මක ගායනයක් නම් කර එහි කවිපද, නාදමාලාව පිළිබඳ පිරික්සන්න.
   (iii) නර්තන නිර්මාණයකදී අවකාශ භාවිතයේ විධිමත් බව පිළිබඳ පැහැදිලි කරන්න.

6. පහත දැක්වෙන A, B සහ C රූප ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.







   (i) A සහ B රූපවලින් දැක්වෙන රසය සහ භාවය ලියා දක්වන්න.
   (ii) A හෝ B ඡායාරූපයෙහි දැක්වෙන රසය ඉස්මතු කළ හැකි අවස්ථාවක් ලියන්න.
   (iii) C රූපයන්හි (1, 2, 3) දැක්වෙන මුද්‍රා නාටකයේ තේමාවෙහි සමාජ ආර්ථික පසුබිම විචාරය කරන්න.

7. (i) රූපවාහිනී නාලිකාවල විකාශනය වන නර්තන වැඩ සටහන් **හතරක්** නම් කරන්න.
   (ii) සාමූහික නර්තන නිර්මාණ ක්‍රියාකාරකමක් තුළින් ලැබෙන කායික මානසික සුවය පිළිබඳ විස්තර කරන්න.
   (iii) තාක්ෂණික දියුණුව ප්‍රාසංගික නර්තන නිර්මාණකරණයට මෙන් ම සංරක්ෂණ ක්‍රියාවලියට ද බෙහෙවින් බලපා ඇත. එම කියමන පහත දැක්වෙන කරුණු ඇසුරෙන් විමසන්න.
   (අ) ගැමි නැටුම් තේමා කොටගත් නර්තන නිර්මාණ
   (ආ) සංරක්ෂණ ක්‍රියාවලියෙහි ප්‍රවර්ධනය

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...